# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1839/10 - 2013 දෙසැම්බර් මස 03 වැනි අඟහරුවාදා - 2013.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : මැදු/3/1/2/71/21.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:* 13/96/එල්ආර්/499.

දුම්බර කඳුවැටි සංරක්ෂණය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩසියපත්තුව දකුණු කෝරළේ, මාංගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මාංගොඩ ගමේ පිහිටි මහනුවර මැනුම් අධිකාරිගේ මු. පි. මහ 5531 දරණ පිඹුරේ කැබැලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6914 ක් වූ ගල්බොක්ක ගලපිට වත්ත නැමැති ඉඩම:

| *කැබලි අංක* | *ප්‍රමාණය (හෙක්.)* | *හිමිකම් කියන අය* |
|---|---|---|
| 01 | 0.6914 | එච්. එම්. ඩී. ජී. මුතු මැණිකා, මාංගොඩ, මැදමහනුවර |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජනවාරි මස 29 වැනි දින පෙ. ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජනවාරි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස අදාළ ඔප්පු සහ ලියකියවිලි මගේ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2013 අගෝස්තු මස 24 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 713


1A - G 018648 - 185 - (2013/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*